**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**2 ශ්‍රේණිය - බුද්ධධර්මය 2021 පෙබරවාරි 2 සතිය**

**සැකසුම = බලංගොඩ අධ්‍යාපන කලාපය**

**R.G.N.K .ස්වර්ණමාලි. ර/බල/කරගස්තලාව ප්‍රාථමික විද්‍යාලය**

# බොදු දරුවකුගේ දින චර්යාව

පුංචි දුවේ පුතේ ඔයාලා කැමතියි නේද කතන්දර අහන්න. දැන් පෙරලා ගන්න. 1 ශ්‍රේණිය බුද්ධාගම පොත. අම්මාත් එක්ක එකතු වෙලා 25 පාඩම කියවන්න.එහි තියනවා ඔයාලගේ පුංචි සුනිමල් යාළුවා දවස ගත කරන ආකාරය

(1) . සුනිමල් දවස ගත කරන ආකාරය දරුවා සමඟ සාකච්ඡා කරන්න.(දෙමව්පියන් දරුවාට සහය වන්න.)

(2). ඔබත් සුනිමල් වගේ දින චර්යාවකට අනුව කටයුතු කරන්න පුරුදු වන්න.

(3). සුනිමල් දවසේ කරන හොඳ වැඩක් චිත්‍රයට අඳින්න.

දරුවනේ , අපි සුනිමල් දවස ගත කරන අකාරය දැන ගත්තා නේද?දැන් එහෙනම් සුනිමල් ගේ දින චර්යාව ලියන අයුරු ඉගෙන ගමු.

| වේලාව | කළ වැඩය |
|---|---|
| උදේ 6.00 | අවදි වුණා.<br>දත් මැද්දා.<br>මූණ සේදුවා.<br>තෙරුවන් වන්දනා කළා. |
| උදේ 6.30 | උදේ ආහාරය ගත්තා.<br>දෙමව්පියන්ට වැන්දා.<br>පාසලට ගියා. |
| උදේ7.30-දහවල්12.00 | පාසලේ ඉගෙනීම් කටයුතු කළා. |
| දවල් 1 | පාසල ඇරී ගෙදර ආවා<br>නෑවා.<br>දහවල් ආහාරය ගත්තා.<br>වාදනයකට සවන් දුන්නා. |
| සවස 2.30 | ගුරුතුමී දුන් ගෙදර වැඩ කළා.<br>සෙල්ලම් කළා. |
| සවස 4 | ගෙදර වැඩට උදවු කළා. |
| සවස 5 | මල් පාත්තිවලට වතුර දැමූවා.<br>බුද්ධ වන්දනාවට මල් නෙළුවා. |
| සවස 6 | වන්දනා කළා.<br>භාවනා කළා. |
| රාත්‍රී 7 | රෑ ආහාර ගත්තා. |
| රාත්‍රී 8 | දත් මැද්දා.<br>දෙමව්පියන් වැන්දා. |
| රාත්‍රී 8.30 | නින්දට ගියා. |

(1). ඉහත දින චර්යාව දෙස බලා ඔබ දවස ගත කරන අයුරු ලියා දක්වන්න.